# නව ලංකා නිදහස් පක්ෂ
# ව්‍යවස්ථාව

## පටුන


පිටුව

**හඳුන්වාදීම** 04

**01 වන වගන්ති**

**02 වන වගන්තිය**

2.1 - නව ලංකා නිදහස් පක්ෂයේ සංවිධාන 04
2.2 - විශේෂ සංවිධාන 05
2.3 - අනු සංවිධාන 05
2.4 - අනුබද්ධ සංවිධාන 05

**03 වන වගන්තිය**

3.1 - ශාඛා සමිතිය 05-06
3.2 - ශාඛා නිලධාරීන් 06

**04 වන වගන්තිය**

මැතිවරණ බල ප්‍රදේශ සංවිධානය

4.1 - සංයුතිය (සාමාජිකත්වය) 07
4.2 - නිලධරී මණ්ඩලය 07
4.3 - බලතල හා වගකීම් 08

**5 වන වගන්තිය**

දිස්ත්‍රික් සංවිධානය

5.1 - සංයුතිය/සාමාජිකත්වය 08
5.2 - නිලධාරී මණ්ඩලය 08-09
5.3 - බලතල හා වගකීම් 09

**6 වන වගන්තිය**

විධායක සභාව

6.1 - සංයුතිය (සාමාජිකත්වය) 09
6.2 - බලතල සහ වගකීම 10

**7 වන වගන්තිය**

7.1 - මධ්‍යම කාරක සභාව 10-11
7.2 - බලතල හා වගකීම් 11-12

**8 වන වගන්තිය**

නිලධාරීන් සතු බලතල සහ වගකීම්

8.1 - සභාපති 13
8.2 - ලේකම් 13-14
8.3 - භාණ්ඩාගාරික 14
8.4 - ජාතික සංවිධායක 14-15
8.5 - නියෝජ්‍ය සභාපති 15

8.6 - නියෝජ්‍ය ලේකම් 15
8.7 - සියලු නිලධාරීන්ගේ වගකීම් 15

**9 වන වගන්තිය**
විනය මණ්ඩලය 15

**10 වන වගන්තිය**
මැතිවරණ කොට්ඨාශ සංවිධායකවරු සහ මැතිවරණ වලට අපේක්ෂකයන් නිර්දේශ කිරීමේ මණ්ඩලය. 16

**11 වන වගන්තිය**
පර්යේෂණ හා පුහුණු ආයතනය 16

**12 වන වගන්තිය**
සාමාජිකත්වය
12.1 - සාමාජිකත්ව වර්ග 16
12.2 - සාමාජිකත්වය ලබා ගැනීම 16-17
12.3 - සාමාජික ගාස්තු 17
12.4 - සාමාජිකත්වයේ වගකීම 17-18

**13 වන වගන්තිය**
උපදේශක සභාව 18

**14 වන වගන්තිය**
නිලවරණය 18

**15 වන වගන්තිය**
පොදු විධිවිධාන 18-19

**16 වන වගන්තිය**
ව්‍යවස්ථා සංශෝධනය 19

# නව ලංකා නිදහස් පක්ෂය

හඳුන්වාදීම

නව ලංකා නිදහස් පක්ෂයේ මූලික ප්‍රතිපත්තිය ප්‍රජාතාන්ත්‍රික සමාජවාදය හෙවත් මැද මාවතයි. සිතීමේ නිදහස, භාෂණයේ නිදහස, රැස්වීමේ නිදහස, තමන් කැමති ආගමක් ඇදහීමේ නිදහස, නූගත් කමින්, දුගී බවින්, රෝග පීඩාවලින් සහ භීෂණයෙන් මිදීමේ නිදහස, සර්ව ජන ඡන්ද බලය හරහා නිදහස් හා සාධාරණ මැතිවරණ තුළින් ආණ්ඩු පත්කර ගැනීමේ නිදහස සහතික කර, අධිකරණය, පොලීසිය, රාජ්‍ය සේවයේ ස්වාධීනත්වය රකින, දූෂණයෙන් සහ භීෂණයෙන් තොර ආණ්ඩු ක්‍රමයක් ස්ථාපිත කිරීම අප ප්‍රතිපත්ති මාලාවේ මූලික ලක්ෂණ වේ.

එක් ප්‍රජාවකට විශේෂ වරප්‍රසාද හෝ අයිතීන් ලබා නොදෙන සෑම පුරවැසියෙකුටම සමාන අයිතීන් සහ ඇගයීමක් සහිත, සමාජයක් බිහි කිරීමේ වැදගත්කම අපි පිළිගනිමු.

සැබෑ ආර්ථික සංවර්ධනයක් සහිත, සියලු ජන කොටස් සහ ආගමිකයන්ගේ අයිතීන් සුරැකුණු, ඔවුන්ගේ විවිධත්වය පිළිගත් පාලනයක් බිහි කිරීමත්, රටේ බාහිර සහ අභ්‍යන්තර ස්වාධිපත්‍යයට හානි නොවන ආකාරයේ නොබැඳි, මිත්‍රශීලී විදේශ ප්‍රතිපත්තියක් ඇති කිරීම සඳහාත් අප පක්ෂය කැප වී සිටියි.

**01 වන වගන්ති**

i. පක්ෂයේ නම ''නව ලංකා නිදහස් පක්ෂය'' වෙයි

ii. පක්ෂයේ මැතිවරණ සළකුණ ''අශ්ව ලාඩම'' වෙයි

iii. වර්ණය ''තද නිල් '' වෙයි

**02 වන වගන්තිය**

නව ලංකා නිදහස් පක්ෂය පහත සංවිධානවලින් සමන්විත වෙයි.

2.1 - i. ශාඛා සමිති

ii. මැතිවරණ බල ප්‍රදේශ සංවිධාන (ආසන මධ්‍ය සංවිධාන)

iii. දිස්ත්‍රික් සංවිධාන

iv. විධායක සභාව

v. මධ්‍යම කාරක සභාව

2.2 - විශේෂ සංවිධාන

i. උපදේශක සභාව/බුද්ධි මණ්ඩලය

ii. විනය මණ්ඩලය

iii. මැතිවරණ කොට්ඨාශ සංවිධායකවරු සහ මැතිවරණ වලට අපේක්ෂිකයින් නිර්දේශ කිරීමේ මණ්ඩලය

iv. මැතිවරණ ක්‍රියාකාරී මණ්ඩලය

v. පර්යේෂණ හා පුහුණු ආයතනය

2.3 - අනු සංවිධාන

i. නව ලංකා නිදහස් තරුණ සංවිධානය

ii. නව ලංකා නිදහස් කාන්තා සංවිධානය

iii. නව ලංකා නිදහස් සේවක සංගමය

2.4 - අනුබද්ධ සංවිධාන

i. නව ලංකා නිදහස් ගුරු සංවිධානය

ii. නව ලංකා නිදහස් වෘත්තියවේදීන්ගේ සංවිධානය (වෛද්‍ය/ඉංජිනේරු/ගණකාධිකාරීන්....)

iii. නව ලංකා නිදහස් ගොවි සංවිධානය

iv. නව ලංකා නිදහස් නීතිඥ සංවිධානය

v. නව ලංකා නිදහස් සංස්කෘතික හා කලා සංවිධානය

**03 වන වගන්තිය**

3.1 - ශාඛා සමිතිය

i. මෙය පක්ෂයේ බිම් මට්ටමේ සංවිධානය වෙයි.

ii. ග්‍රාම සේවා කොට්ඨාශ මට්ටමින් හෝ ඡන්ද පොළ මට්ටමින් ශාඛා සංවිධාන පිහිටුවිය යුතුය.

iii. ශාඛා සමිතියක් පිහිටුවීම සඳහා අවම වශයෙන් සාමාජිකයින් විස්සක් අවශ්‍ය වේ.

iv. ඡන්ද පොළකට හෝ ග්‍රාම සේවා වසමකට පිහිටුවිය යුතු ශාඛා සමිති ප්‍රමාණය තීරණය කිරීමේ බලය පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ උපදෙස් මත අදාළ මැතිවරණ බල ප්‍රදේශ සංවිධානයට පවතී.

v. සිය බල ප්‍රදේශයේ පොදු කටයුතුවල අඩුපාඩු සොයා බලා ඒවා නිවැරදි කිරීමට ප්‍රමුඛත්වය ගැනීම, ශ්‍රමදාන මගින් බල ප්‍රදේශයේ අඩු පාඩු සකස් කරගැනීම, පොදුවේ සිය බල ප්‍රදේශයේ ජීවත්වන සියලු දෙනා අතර සාමය, සමගිය ඇති කිරීමට පියවර ගැනීම, සිය බල ප්‍රදේශයේ ජීවත්වන ආබාධිත හෝ අතිශයින්ම දුගී පවුල්වලට ඔවුන්ගේ ගැටලු විසඳා ගැනීම සඳහා වැඩපිළිවෙළක් සකස් කර, දේශපාලන හා අනෙකුත් සංවිධාන සහභාගී කර ගනිමින් ගමේ පොදු කටයුතු සංවිධානය කිරීමට ප්‍රමුඛත්වය ගැනීම, සිය බල ප්‍රදේශයේ පූජනීය ස්ථාන සමග මනා සම්බන්ධතාවක් ගොඩනගා ගැනීම, කිසිවෙකුට අපහාස නොකොට, සිය බල ප්‍රදේශයේ පක්ෂ ප්‍රවර්ධන කටයුතු සිදු කිරීම, පැවැත්වෙන ඕනෑම මැතිවරණයකදී පක්ෂයට උපරිම ඡන්ද ප්‍රමාණයක් සිය බල ප්‍රදේශයෙන් ලබාගැනීමට කටයුතු කිරීම ශාඛා සමිතියේ ප්‍රධාන කාර්ය භාරයන් වේ.

vi. මධ්‍යම කාරක සභාවේ අනුමැතියට යටත්ව උසස් අධ්‍යාපන ආයතන සහ විදේශ රටවල, ශාඛා සමිති පිහිටුවිය හැකිය.

3.2 - ශාඛා නිලධාරීන්

පහත සඳහන් නිලධාරී මණ්ඩලය ශාඛා සමිතියේ වාර්ෂික රැස්වීමේ දී සාමාජිකයන්ගේ තෝරාගත යුතු ය.

i. සභාපති

ii. ලේකම්

iii. උප සභාපති

iv. උප ලේකම්

v. භාණ්ඩාගාරික

vi. කාරක සභාව (10 දෙනෙක්)

ගමේ ජීවත් වන ප්‍රභූන් අනුශාසකවරුන් ලෙස පත්කරගත හැකිය. අනුශාසකවරුන් පක්ෂයේ සාමාජිකත්වය ලබාගැනීම අනිවාර්ය නොවේ.

ශාඛා සමිතියේ සංයුතිය සකස් වීමේ දී සමස්ත නිලධාරී මණ්ඩලයෙන් සියයට 30ක් වයස අවුරුදු 40ට අඩු විය යුතු අතර සියයට 25ක් කාන්තාවන් විය යුතුය.

**04 වන වගන්තිය**

මැතිවරණ බල ප්‍රදේශ සංවිධානය (ආසන මධ්‍ය සංවිධානය)

4.1 - සංයුතිය (සාමාජිකත්වය)

i. මැතිවරණ කොට්ඨාශ සංවිධායකවරු සහ මැතිවරණ අපේක්ෂකයින් නිර්දේශ කිරීමේ මණ්ඩලයේ නිර්දේශ මත පක්ෂයේ සභාපති විසින් සෑම මැතිවරණ බල ප්‍රදේශයකටම සංවිධායකවරයකු බැගින් පත් කළ යුතුය. එකී සංවිධායක නිල බලයෙන් මැතිවරණ බල ප්‍රදේශ සංවිධානයේ සභාපතිවරයා ද වෙයි.

ii. අදාළ මැතිවරණ බල ප්‍රදේශයේ ඇති ශාඛා සමිතිවල සභාපති, ලේකම් යන නිලධාරීන් නිල බලයෙන්,

iii. අදාළ මැතිවරණ බල ප්‍රදේශයේ ස්ථිරව පදිංචි පක්ෂයේ පළාත් සභා නියෝජිතයින් නිල බලයෙන්,

iv. අදාළ මැතිවරණ බල ප්‍රදේශයට අයත් පළාත් පාලන ආයතනවල පක්ෂය නියෝජනය කරන සියලු නියෝජිතයින් නිල බලයෙන්,

v. මෙම ව්‍යවස්ථාවේ 2 වන වගන්තියේ 2.3 සහ 2.4 අනු වගන්ති යටතේ ඇති සියලුම සංවිධානවල මැතිවරණ බල ප්‍රදේශ සංවිධානයන්හි සභාපති, ලේකම් බල ප්‍රදේශ සංවිධානයට නිල බලයෙන් පත් වේ.

4.2 - නිලධරී මණ්ඩලය

මැතිවරණය බල ප්‍රදේශ සංවිධානය විසින් පහත දැක්වෙන නිලධාරි මණ්ඩලය වාර්ෂිකව සාමාජිකයන්ගේ නිලවරණයක් හරහා පත් කරගත යුතුය.

| | | |
|---|---|---|
| i. | සභාපති ආසන සංවිධානයක නිල බලයෙන් | 25 |
| ii. | ලේකම් | |
| iii. | භාණ්ඩාගාරික | |
| iv. | උප සභාපති තනතුරු 3 | |
| v. | උප ලේකම් තනතුරු 4 | |
| vi. | කාරක සභිකයින් 15 | |

තේරී පත්වන නිලධාරී මණ්ඩලය මැතිවරණ බල ප්‍රදේශයේ ක්‍රියාකාරී මණ්ඩලය වන්නේ ය.

මැතිවරණ බල ප්‍රදේශ සංවිධානයේ නිලධාරී මණ්ඩලයෙන් සියයට 30ක් වයස අවුරුදු 40ට අඩු තරුණයන් ද, සියයට 25ක් කාන්තාවන් ද විය යුතුය.

4.3 බලතල හා වගකීම්

i. ආසන සංවිධායකවරුන් සහ මැතිවරණ අපේක්ෂකයන් නිර්දේශ කිරීම.

ii. අපේක්ෂකයන් මැතිවරණ සඳහා සූදානම් කිරීම.

iii. මූල්‍ය කටයුතු භාණ්ඩාගාරික ප්‍රධාන 5 දෙනෙකුගෙන් යුතු මූල්‍ය කමිටුවක් හරහා සිදු කළ යුතු අතර සියලු ගිණුම් වාර්ෂිකව මධ්‍යම කාරක සභාවට ලබාදිය යුතුය.

iv. අදාළ මැතිවරණ බල ප්‍රදේශ තුළ පක්ෂ ප්‍රතිපත්ති ප්‍රවර්ධනයට කටයුතු කිරීම.

v. අදාළ මැතිවරණ බල ප්‍රදේශ තුළ පක්ෂයෙන් පැවරෙන සියලු කටයුතු සිදු කිරීම.

**5 වන වගන්තිය**

දිස්ත්‍රික් සංවිධානය (දිස්ත්‍රික් බල මණ්ඩලය)

5.1 සංයුතිය/සාමාජිකත්වය

i. දිස්ත්‍රික්කයේ ආසන සංවිධායකවරුන් නිල බලයෙන්,

ii. ආසන බල මණ්ඩල ලේකම්වරු සහ භාණ්ඩාගාරිකවරුන් නිල බලයෙන්,

iii. දිස්ත්‍රික්කය නියෝජනය කරන පාර්ලිමේන්තු සහ පළාත් සභා මන්ත්‍රීවරු නිල බලයෙන්,

iv. දිස්ත්‍රික්කයට අයත් පළාත් පාලන ආයතනවල සභාපති/උප සභාපති හෝ විපක්ෂ නායකවරු, කණ්ඩායම් නායකවරු නිල බලයෙන්,

v. මෙම ව්‍යවස්ථාවේ 2.3 සහ 2.4 අනු වගන්තිවල සඳහන් සංවිධානයන්හි දිස්ත්‍රික් සංවිධානවල සභාපති, ලේකම් සහ භාණ්ඩාගාරික නිල බලයෙන්,

vi. දිස්ත්‍රික් සංවිධායකවරු නිල බලයෙන්, දිස්ත්‍රික් සංවිධානයට පත් වේ.

5.2 නිලධාරී මණ්ඩලය

දිස්ත්‍රික් සංවිධානය විසින් පහත දැක්වෙන නිලධාරී මණ්ඩලය පත්කර ගත යුතුය.

i. සභාපති - පක්ෂයේ සභාපති විසින් නම් කරනු ඇත.
ii. ලේකම්
iii. භාණ්ඩාගාරික
iv. උප සභාපති 4
v. උප ලේකම් 5

(i–v: 27)

vi කාරක සභිකයින් 15 දෙනෙක්

දිස්ත්‍රික් සංවිධානයේ නිලධාරී මණ්ඩලයෙන් සියයට 30ක් වයස අවුරුදු 40 ට අඩු තරුණයන් ද, සියයට 25 ක් කාන්තාවන්ද විය යුතුයි.

5.3 බලතල හා වගකීම්

i. ආසන සංවිධායකවරුන් සහ මැතිවරණ අපේක්ෂකයන් නිර්දේශ කිරීම.

ii. අපේක්ෂකයන් මැතිවරණ සඳහා සූදානම් කිරීම.

iii. මූල්‍ය කටයුතු භාණ්ඩාගාරික ප්‍රධාන 5 දෙනෙකුගෙන් යුතු මූල්‍ය කමිටුවක් හරහා සිදු කළ යුතු අතර සියලු ගිණුම් වාර්ෂිකව මධ්‍යම කාරක සභාවට ලබාදිය යුතුය.

iv. අදාළ දිස්ත්‍රික්කය තුළ පක්ෂ ප්‍රතිපත්ති ප්‍රවර්ධනයට කටයුතු කිරීම.

v. අදාළ දිස්ත්‍රික්කය තුළ පක්ෂයේ පැවරෙන සියලු කටයුතු සිදු කිරීම.

**6 වන වගන්තිය**

විධායක සභාව

6.1 සංයුතිය (සාමාජිකත්වය)

i. පක්ෂයේ සියලුම ආසන සංවිධායකවරු නිල බලයෙන්,

ii. පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු, පළාත් සභා මන්ත්‍රීවරු, පළාත් පාලන ආයතන සභාපතිවරු, විපක්ෂ නායකවරු හෝ කණ්ඩායම් නායකවරු නිල බලයෙන්,

iii. දිස්ත්‍රික් සංවිධාන සභාපති සහ ලේකම් නිල බලයෙන්,

iv. මෙම ව්‍යවස්ථාවේ 2.3 සහ 2.4 අනු ව්‍යවස්ථාවන්හි සඳහන් සංවිධානවල ජාතික සංවිධානයේ සභාපති, ලේකම් නිල බලයෙන්,

v. විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරමින් පක්ෂයේ කටයුතුවලට සහාය වන 20 දෙනෙකුට නොවැඩි පිරිසක් විධායක සභාව සඳහා පත්කිරීමට පක්ෂයේ සභාපතිවරයාට බලය තිබේ.

vi. පක්ෂයේ සාමාජිකත්වය දරණ යම් සාමාජිකයෙකු ජනරජයේ ජනාධිපති හෝ අගමැති තනතුර දරන ලද්දේ නම් ඔහුට/ඇයට විධායක සභාවේ සාමාජිකත්වය පිරිනැමිය යුතුය.

vii. විධායක සභාවේ සංයුතියෙන් සියයට 30ක් අවුරුදු 40ට අඩු තරුණයන් ද, සියයට 25ක් කාන්තාවන් ද විය යුතු අතර සියලු ප්‍රධාන ජනවර්ග හා ප්‍රධාන ආගම් නියෝජනය වන පරිදි සංයුතිය සකස් විය යුතුය.

6.2 බලතල සහ වගකීම

i. විධායක සභාව මාස තුනකට වරක් රැස් විය යුතුය. නොදන්වා අඛණ්ඩව තෙවරක් විධායක සභා රැස්වීම් සඳහා සහභාගී නොවුණ හොත් විධායක සභිකයන්ගේ සාමාජිකත්වය අහෝසි වේ.

ii. පක්ෂය ඉදිරිපත් වන මැතිවරණවලදී පක්ෂයේ ජයග්‍රහණය උදෙසා මධ්‍යම කාරක සභාවේ මග පෙන්වීම් අනුව සුදුසු වැඩ පිළිවෙළක් සකස් කිරීම හා එය ක්‍රියාත්මක කිරීමට මධ්‍යම කාරක සභාවට ඉදිරිපත් කිරීම.

iii. පක්ෂයේ විධායක සභාවේ ඡන්දයෙන් වාර්ෂිකව පක්ෂයේ පහත නිලධාරීන් පත්කර ගත යුතුය.

i. සභාපති - තනතුරු 01

ii. නියෝජ්‍ය සභාපති - තනතුරු 01

iii. ජාතික සංවිධායක - තනතුරු 01

iv. ජ්‍යෙෂ්ඨ උප සභාපති - තනතුරු 05

v. උප සභාපති - තනතුරු 10

vi. ලේකම් - තනතුරු 01

vii. නියෝජ්‍ය ලේකම් - තනතුරු 01

viii. උප ලේකම් - තනතුරු 09

ප්‍රචාරක ලේකම් - තනතුරු 01
නීති කටයුතු ලේකම් - තනතුරු 01
ජාත්‍යන්තර කටයුතු ලේකම් - තනතුරු 01
} උප ලේකම්වරු හත්දෙනාගෙන් තිදෙනෙක් මේ සඳහා පත්කළ යුතුය.

ix. පාලක ලේකම් - තනතුරු 01 ( ඡන්ද බලය හිමි නොවන නිලධාරී මණ්ඩලයට අයත් නොවන අයෙක්)

**7 වන වගන්තිය**

7.1 - මධ්‍යම කාරක සභාව

1. මෙය පක්ෂයේ උත්තරීතර මණ්ඩලය වන්නේය. පක්ෂයේ සභපති මෙහි සභපති වන අතර පක්ෂයේ ලේකම් මෙහි ලේකම්වරයා වන්නේය.

2. විධායක සභාවෙන් පත් කෙරෙන නිලධාරීන් 8

- සභාපති,
- ලේකම්,
- භාණ්ඩාගාරික,

- ජාතික සංවිධායක,
- නියෝජ්‍ය සභාපති,
- නියෝජ්‍ය ලේකම්,
- ප්‍රචාරක ලේකම්,
- නීති ලේකම්
- ජ්‍යෙෂ්ඨ උප සභාපතිවරුන් - 05
- උප සභාපතිවරුන් - 3
- උප ලේකම් - 2 } සභාපති විසින් නම් කෙරේ

ඉහත නිලධාරීන් අතුරින් නියෝජනය නොවන දිස්ත්‍රික්ක වල දිස්ත්‍රික් නායකයින් 2.3, 2.4 වගන්තිවල සඳහන් සංවිධානවල සභාපති, ලේකම්වරුන් ට අමතරව පක්ෂයේ විධායක සභිකයින් අතරින් පක්ෂයේ සභාපති විසින් පත් කරන 7 දෙනකු මීට අයත් වෙති.

මධ්‍යම කාරක සභාවේ සංයුතිය සැකසීමේ දී සියයට 30ක් අවුරුදු 40ට අඩු තරුණයන් ද, සියයට 25ක් කාන්තාවන් ද විය යුතු අතර සියලු ප්‍රධාන ජාතීන් හා ආගම් නියෝජනය වන පරිදි සංයුතිය සකස් විය යුතු ය.

7.2 - බලතල හා වගකීම්

1. පක්ෂයේ ප්‍රතිපත්ති ආරක්ෂා කරගනිමින් හා ප්‍රවර්ධනය කිරීම හා පක්ෂයේ විනය ආරක්ෂා කර ගැනීම.
2. පක්ෂ සභාපතිගේ හා ලේකම්ගේ උපදෙස් මත පක්ෂයේ සංවිධායකවරුන් සහ මැතිවරණ අපේක්ෂකයන් තෝරා පත් කර ගැනීමේ දී යහපාලන ප්‍රතිපත්ති හා අරමුණු අවබෝධ කරගත් අවංක, කාර්යක්ෂම සහ ජනතා අභිවෘද්ධිය සඳහා කටයුතු කිරීමේ හැකියාව ඇති පිරිසක් තෝරාගෙන ඔවුන්ට මනා පුහුණුවක් ලබාදිය යුතුය.
3. ඒ පුහුණු විධිමත් ව සිදු කිරීමට විශේෂ පුහුණු ආයතනයක් ගොඩනැගීම.
4. පක්ෂයේ විධායක සභාව විසින් කෙටුම්පත් කරන ව්‍යවස්ථා සහ ප්‍රතිපත්ති සංශෝධන යෝජනා මධ්‍යම කාරක සභාව විසින් අනුමත කිරීමෙන් පසු ඒවා සක්‍රීය තත්වයට පත්වේ.
5. පක්ෂයේ ප්‍රතිපත්ති සහ ව්‍යවස්ථා සංශෝධන යෝජනා කෙටුම්පත් කර, විධායක සභාවට ඉදිරිපත් කර එකඟතාව ලබා ගැනීම.
6. පක්ෂයේ අරමුදල් පාලනය සඳහා මධ්‍යම කාරක සභාවට වග කියන භාණ්ඩාගාරිකගේ සභාපතිත්වයෙන් යුත් පස් දෙනෙකුගෙන් යුතු මූල්‍ය අනු කමිටුවක් මධ්‍යම කාරක සභාව විසින් පත් කළ යුතුය. මුදල් පරිපාලනයේ සියලු බලතල මූල්‍ය අනු කමිටුවක් සතු වන අතර වාර්ෂිකව අදාළ ගිණුම් වාර්තා මධ්‍යම කාරක සභාව අනුමත කරන ලද පිළිගත් ආයතනයක් ලවා විගණනය කළ යුතු අතර එම වාර්තාව මධ්‍යම කාරක සභාවෙන් අනුමත කරගත යුතුය.

7. සියලු මැතිවරණවලදී ඒ ඒ මැතිවරණයට අදාළ ප්‍රතිපත්ති ප්‍රකාශයන් කෙටුම්පත් කර, විධායක සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම.

8. සභාපතිවරයාගේ යෝජනා අනුව කාලානුරූපව අවශය වන පරිදි මධ්‍යම කාරක සභාවේ සාමාජික සංඛ්‍යාව වෙනස් කිරීමට මධ්‍යම කාරක සභාවට බලය තිබේ.

9. ලේකම්වරයාගේ ලිඛිත උපදෙස් පරිදි පක්‍ෂයේ සාමාජිකයකු පිළිබඳව විනය මණ්ඩලය විසින් පවත්වන පරීක්‍ෂණයකින් පසු මධ්‍යම කාරක සභාවට ඉදිරිපත් කරන වාර්තාවක් අනුව එකී සාමාජිකයාගේ සාමාජිකත්වය අහෝසි කිරීමේ බලය මධ්‍යම කාරක සභාව සතුවේ.

10. අවශ්‍ය අවස්ථාවන්වලදී සභාපතිවරයාගේ යෝජනාව අනුව මෙම ව්‍යවස්ථාවේ 4.2 සහ 5.2 අනු වගන්තිය යටතේ ඇති සංවිධාන සඳහා සාමාජිකයන් පත් කිරීම හා ඉවත් කිරීමේ බලය ද එකී සංවිධානවල කාර්යභාරයන් හා වගකීම් තීරණය කිරීමේ බලය ද මධ්‍යම කාරක සභාව සතු වේ.

11. පක්ෂයේ කටයුතු ප්‍රවර්ධනය සඳහා පක්ෂයේ වෙනත් සංවිධාන පිහිටුවා ගැනීමට සහ ඒවායේ බලතල සහ කාර්යභාරයන් තීරණය කිරීමට ද මධ්‍යම කාරක සභාවට බලය තිබේ.

12. මෙම ව්‍යවස්ථාවේ පැහැදිලිව සඳහන්ව ඇති ඕනෑම කරුණක් පිළිබඳව මධ්‍යම කාරක සභාව විසින් දෙනු ලබන තීරණය ඒ පිළිබඳ අවසන් තීරණය වේ.

13. පක්ෂයේ නිලධාරීන්ගේ පුරප්පාඩුවක් ඇති වූ විට ඊළඟ නිලවරණය දක්වා ඒ තනතුර තාවකාලිකව පිරවීට මධ්‍යම කාරක සභාවට බලය තිබේ.

14. මධ්‍යම කාරක සභාවේ ගණ පූර්ණය 1/3 කි.

15. මධ්‍යම කාරක සභාව රැස්කිරීමේ බලය සභාපතිවරයාට හිමි වේ. සභාපතිවරයා නොමැති අවස්ථාවල නියෝජ්‍ය සභාපතිවරයාගේ උපදෙස් මත ප්‍රධාන ලේකම්වරයාට මධ්‍යම කාරක සභාව කැඳවීමේ බලය ඇත. සභාපතිවරයා හෝ නියෝජ්‍ය සභාපතිවරයා නොමැතිව මධ්‍යම කාරක සභාව රැස්විය නොහැකි ය.

15. පාර්ලිමේන්තු, පළාත් සභා සහ පලාත් පාලන මන්ත්‍රීවරුන් ගෙන් අය කළ යුතු සාමාජික ගාස්තුව මධ්‍යම කාරක සභාව තීරණය කරන අතර එම මුදල් අය කර ගැනීමේ වගකීම මුදල් කමිටුවට හිමි වේ.

16. අනුබද්ධ සංවිධානවලින් හෝ විශේෂිත පුද්ගලයන් අතුරින් විශේෂ අවස්ථාවල දී 10කට නොවැඩි පිරිසක් මධ්‍යම කාරක සභාවට කැඳවීමේ බලය සභාපතිවරයාට හිමි වේ.

**8 වන වගන්තිය**

නිලධාරීන් සතු බලතල සහ වගකීම්

8.1 - සභාපති

i පක්ෂයේ විනය, කීර්තිනාමය, ප්‍රතිපත්ති සහ පොදුවේ පිළිගත් ආචාර ධර්ම ආරක්ෂා කරමින්, සියලු පක්ෂ සාමාජිකයින්ට ඒ සඳහා අනුබල ලබා දීම.

ii. පක්ෂය හා පක්ෂයේ සියලු ආයතන හා කමිටුවල ක්‍රියාකාරීත්වය අධීක්ෂණය කිරීම.

iii. පක්ෂ ව්‍යවස්ථාව මගින් පවරා ඇති බලතල ක්‍රියාත්මක කිරීම.

iv. මධ්‍යම කාරක සභාව, විධායක සභාව ඇතුළු ඕනෑම අනුබද්ධ සංවිධානයක සභා වාරයන් කැඳවීමේ බලය සභාපති සතු වේ.

v. පක්ෂයේ කීර්ති නාමයට, උන්නතියට, පැවැත්මට හානි කරන බව විනය කමිටුව විසින් නිර්දේශ කරන ලද ඕනෑම සාමාජිකයෙකුගේ සාමාජිකත්වය අහෝසි කිරීම සහ අනුබද්ධ සංවිධානයක වැඩකටයුතු තහනම් කිරීමේ බලය සභාපතිවරයා සතු වේ.

ඉහත වගන්තිය යටතේ පක්ෂ සාමාජිකත්වයක් හෝ සංවිධානයක් තහනම් කරනු ලැබූ අවස්ථාවක දින 14ක් තුළ ඒ බව මධ්‍යම කාරක සභාවට වාර්තා කළ යුතු අතර සති 06 ක් ඇතුළත විනය කමිටුව ඒ සඳහා විනය කටයුතු සිදු කර මධ්‍යම කාරක සභාවට වාර්තා කළ යුතුය.

vi. 10 වන වගන්තිය සහ 7.2 වගන්තියට යටත්ව පක්ෂයේ ආසන සංවිධායකවරුන් පත්කිරීම.

vii. මධ්‍යම කාරක සභාවේ අනුමැතියට යටත්ව මැතිවරණ කොට්ඨාශ සංවිධායකවරු සහ මැතිවරණවලට අපේක්ෂකයන් නිර්දේශ කිරීමේ මණ්ඩල හා මැතිවරණ ක්‍රියාකාරී කමිටු ඇතුළු 2.2 වගන්තිවල සඳහන් කමිටු පත් කිරීම.

viii. මධ්‍යම කාරක සභාවේ අනුමැතිය මත වෙනත් පක්ෂ සහ සංවිධාන සමග සන්ධානගත වීම හෝ එක්ව කටයුතු කිරීමට සභාපතිට හැකියාව තිබේ.

ix. ජාත්‍යන්තර සංවිධාන, විදේශ රාජ්‍යයන් හා පක්ෂ සමග සබඳතා ගොඩනගා ගැනීමේ වගකීම සභාපති, ලේකම්, නියෝජ්‍ය සභාපති හා ජාතික සංවිධායකට පැවරෙන අතර ඒවා මැනවින් ක්‍රියාත්මක කිරීමේ වගකීම නියෝජ්‍ය සභාපතිට පැවරේ.

8.2 - ලේකම්

i පක්ෂයේ විනය, කිර්තිනාමය හා ප්‍රතිපත්ති හා පොදුවේ පිළිගත් ආචාරධර්ම ආරක්ෂා කරමින් අනෙක් පක්ෂ සාමාජිකයන්ට ද ඒ සඳහා අනුබල ලබාදීම.

ii පක්ෂය හා පක්ෂයේ සියලු ආයතන හා කමිටු මැනවින් ක්‍රියාත්මක කරවීම.

iii පක්ෂ සාමාජිකයන්ගේ විනය කඩවීමකදී ඒ සඳහා කඩිනමින් ක්‍රියාත්මක වී පක්ෂ විනය මැනවින් පවත්වාගෙන යාම.

iv සභාපති විසින් පවරනු ලබන පක්ෂයේ වැඩකටයුතු විධිමත් ව ඉටු කිරීම.

v මධ්‍යම කාරක සභාව විසින් වරින් වර ගනු ලබන තීරණ පිළිබඳ පක්ෂයේ සියලු ආයතන කඩිනමින් දැනුවත් කිරීම.

vi කාර්යාල කටයුතු, සභා වාර්තා සහ සාමාජික ලේඛනය නිසි පරිදි පවත්වාගෙන යාම.

vii පක්ෂ ව්‍යවස්ථාවේ 2.3, 2.4, 3, 4 සහ 5 වගන්තිවල සඳහන් ආයතන ගොඩනැගීම, සාමාජිකත්ව ප්‍රවර්ධනය සහ ශක්තිමත් කිරීම, පක්ෂයේ ඉදිරි ගමනට අදාළ සැලසුම් සකස් කර එම ආයතනවලට ලබාදීම සහ ඒවායෙහි ප්‍රගතිය අධීක්ෂණය කර විධායක සභාව සහ මධ්‍යම කාරක සභාව දැනුවත් කිරීම.

viii මැතිවරණ කොමිෂන් සභාව සමග සම්බන්ධිකරණයක් පවත්වා ගනිමින් ඊට අනුකූලව පක්ෂයේ ඉදිරි කටයුතු ක්‍රියාත්මක කිරීමට මැදිහත් වීම. මධ්‍යම කාරක සභාවේ අනුමැතියට යටත්ව මැතිවරණ අපේක්ෂක ලැයිස්තු සකස් කිරීම සහ ඊට අදාළ වගකීම දැරීම.

ix. පක්ෂයේ ලේකම් ධුරය පූර්ණ කාලීන තනතුරක් බැවින් පූර්ණ කාලීනව පක්ෂයේ උන්නතිය වෙනුවෙන් කැපවී කටයුතු කළ යුතුය.

x සියලු කටයුතු සඳහා සභාපතිගේ අනුමැතිය ලබාගත යුතු අතර ඒ පිළිබඳ පසුව මධ්‍යම කාරක සභාව ද දැනුවත් කළ යුතු ය.

8.3 - භාණ්ඩාගාරික

i සාමාජිකයන් 05 දෙනෙකුගෙන් යුත් මූල්‍ය අනු කමිටුවේ සභාපති ලෙස කමිටු සාමාජිකයන් සමග පක්ෂයේ මූල්‍ය කටයුතු මනාව පවත්වාගෙන යාම.

ii පක්ෂයේ ඉදිරි ගමන වෙනුවෙන් අරමුදල් සම්පාදනය කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සහ අවශ්‍යතා වෙනුවෙන් මුදල් ලබාදීම.

8.4 - ජාතික සංවිධායක

i මේ ව්‍යවස්ථාවේ 2.3, 2.4, 3, 4 සහ 5 වගන්තිවල සඳහන් සංවිධාන ගොඩනැගීම, ශක්තිමත් කිරීම, සාමාජිකයන් බඳවා ගැනීම සහ ඔවුන්ට සැලසුම් ලබාදීම.

ii එම සැලසුම් මැනවින් ක්‍රියාත්මක කරවීම.

iii ප්‍රචාරක ලේකම් වරයා සමග එක්ව පක්ෂයේ ප්‍රචාරක කටයුතු සැලසුම් කිරීම සහ ඒවා විධිමත්ව ක්‍රියත්මක කිරීම.

iv සාමාජිකයන් ප්‍රවර්ධනය කිරීම හා ශක්තිමත් කිරීම.

v  ව්‍යවස්ථාවේ 7.2 සඳහන් පුහුණු ආයතනය ගොඩනැගීම සම්බන්ධීකරණය කිරීම සහ පුහුණු වැඩසටහන් විධිමත්ව මෙහෙයවීම.

8.5 - නියෝජ්‍ය සභාපති

i  සභාපතිවරයා නොමැති විටෙක සභාවේ මුලසුන දැරීම.

ii  ජාත්‍යන්තර වශයෙන් පක්ෂය ප්‍රවර්ධනය කිරීම සහ ජාත්‍යන්තර ප්‍රජාව සමග මනා සම්බන්ධීකරණයක් ගොඩනගා ගැනීම.

iii  පක්ෂයේ ප්‍රතිපත්ති සැලසුම් කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට පක්ෂ සභාපතිවරයාට සහාය වීම.

iv  පක්ෂ ව්‍යවස්ථාවෙන් පක්ෂ සභාපතිවරයාට හිමි බලතල සභාපතිගේ ලිඛිත අනුමැතිය මත ඔහු නොමැති අවස්ථාවක ක්‍රියාත්මක කිරීම.

8.6 - නියෝජ්‍ය ලේකම්

i  ප්‍රධාන ලේකම්වරයාගේ වැඩකටයුතුවලට සහාය වීම.

ii  ප්‍රධාන ලේකම් නොමැති අවස්ථාවල ලේකම් ධුරයේ වැඩකටයුතු ආවරණය කිරීම හා පක්ෂ ව්‍යවස්ථාවේ පක්ෂ ලේකම්වරයාට හිමි බලතල ක්‍රියාත්මක කිරීම.

8.7 - සියලු නිලධාරීන්ගේ වගකීම

පක්‍ෂ ප්‍රතිපත්ති හා විනය ආරක්‍ෂා කිරීමට කටයුතු කිරීම සහ ඒවා ක්‍රියාත්මක කිරීමට සභාපති ලේකම්ට සහාය වීම.

**9 වන වගන්තිය**

විනය මණ්ඩලය

- පක්ෂය තුළ දැඩි විනයක් පවත්වාගෙන යාමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා මධ්‍යම කාරක සභාව විසින් මධ්‍යම කාරක සභාව තුළ හෝ ඉන් බාහිරව 05 දෙනෙකුගෙන් යුතු විනය මණ්ඩලයක් පතත් කළ යුතු ය. මේ විනය මණ්ඩලයේ වගකීම හා කාර්යභාරය, ඒ ඒ විනය ක්‍රියාව සඳහා පත් කරන සාමාජික සංඛ්‍යාව පක්ෂ සභාපතිවරයා සහ ලේකම්වරයා විසින් තීරණය කරනු ලබයි.
- පක්‍ෂ නිලධාරියෙකුට කිසියම් පිළිගත හැකි චෝදනාවක් ඉදිරිපත් වුවහොත් චූදිතයාට විරුද්ධව විනය මණ්ඩලය විසින් මාසයක් ඇතුලත විමර්ශනයක් ආරම්භ කළ යුතු අතර මාස තුනක් තුළ විමර්ශනය අවසන් කර මධ්‍යම කාරක සභාවට විමර්ශන වාර්තාව ඉදිරිපත් කළ යුතුය. විමර්ශනය ආරම්භ කළ විට අදාළ චූදිතයා පක්‍ෂයේ සියලු බලතල වලින් තාවකාලිකව ඉවත් විය යුතුය. චෝදනාව සනාථ වුවහොත් ඔහුගේ නිලය අහිමි වන අතර ඔහු පිළිබඳ ගනු ලබන අනෙකුත් විනය ක්‍රියා මාර්ග මධ්‍යම කාරක සභාවට තීරණය කළ හැකිය.

**10 වන වගන්තිය**

මැතිවරණ කොට්ඨාශ සංවිධායකවරු සහ මැතිවරණ වලට අපේක්ෂකයන් නිර්දේශ කිරීමේ මණ්ඩලය.

මේ සඳහා මධ්‍යම කාරක සභාව විසින් 05 දෙනෙකු නම් කළ යුතුය. එම පිරිස මධ්‍යම කාරක සභාවේ හෝ ඉන් පරිබාහිරව හෝ විය හැකිය.

සෑම මැතිවරණයකටම අපේක්ෂක ලැයිස්තුවේ සියයට 40ක් අවුරුදු 40ට අඩු තරුණයන් ද, පොදුවේ සියලු අපේක්ෂකයන්ගෙන් සියයට 30ක් කාන්තාවන් ද විය යුතුය.

මැතිවරණ කොට්ඨාශ සංවිධායකවරුන් නිර්දේශ කිරීමේ දී ආසන මධ්‍ය සංවිධානයේ සහ දිස්ත්‍රික් සංවිධානයේ යෝජනා සහ අදහස් ලබාගත යුතුය. එම යෝජනාවලට පරිබාහිර නම් යෝජනා කරන්නේ නම් ඉහත සංවිධාන දෙකට ඊට හේතු ඉදිරිපත් කළ යුතුය.

මැතිවරණ සමයේ දී කොට්ඨාශ මැතිවරණ කමිටු ගොඩනැගීමේ සම්බන්ධීකරණය සිදු කළ යුතුය.

**11 වන වගන්තිය**

පර්යේෂණ හා පුහුණු ආයතනය

පක්ෂ මධ්‍යම කාරක සභාවේ නිර්දේශ මත මෙම ආයතනය පිහිටුවිය යුතු අතර සභාපති සහ ලේකම්ගේ උපදෙස් මත පුහුණු ආයතනය ගොඩනැගීම සම්බන්ධීකරණය කර, පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ වගකීම ජාතික සංවිධායක වෙත පැවරේ.

**12 වන වගන්තිය**

සාමාජිකත්වය

12.1 සාමාජිකත්ව වර්ග

නව ලංකා නිදහස් පක්ෂය සාමාජිකත්වය ලබා ගැනීම දෙයාකාරයකින් කළ හැකිය.

i. සාමාන්‍ය සාමාජිකත්වය

ii. යාවජීව සාමාජිකත්වය

12.2 සාමාජිකත්වය ලබා ගැනීම

i. ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතුය

ii. වයස අවුරුදු 18 සම්පූර්ණ වී සිටිය යුතුය.

iii. සාමාජිකත්ව අයදුම්පතක් පුරවා, පක්ෂයේ මැතිවරණ බලප්‍රදේශ සංවිධායකවරයාට හෝ ප්‍රධාන කාර්යාලයට බාරදිය යුතුය.

iv. අයදුම්පත බාරදෙන අවස්ථාවේ වාර්ෂික සාමාජික මුදල් ගෙවිය යුතුය.

v. අවුරුද්දේ ඕනෑම දිනක සාමාජිකත්වය ලැබිය හැකිය. එහෙත් වාර්ෂික සාමාජිකත්වය සෑම වසරකම දෙසැම්බර් 31 දිනෙන් අවසන් වේ. ඒ අනුව සෑම වසරකම දෙසැම්බර් 01 දින සිට ඊළඟ වසරේ ජනවාරි 31 දින දක්වා නව වසර සඳහා සාමාජික ගාස්තු ගෙවා සාමාජිකත්වය අලුත් කරගත යුතුය.

vi. වෙනත් දේශපාලන පක්ෂයක සාමාජිකත්වය දරණ අයෙකුට වුවද නව ලංකා නිදහස් පෙරමුණ හි සාමාජිකත්වය ලබාගත හැකිය. එහෙත් නව ලංකා නිදහස් පෙරමුණෙහි සාමාජිකත්වය දරන්නෙකු වෙනත් දේශපාලන පක්ෂයක සාමාජිකත්වය අයදුම් කරන්නේ නම් ඊට පෙර පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ ලිඛිත අනුමැතිය ලබාගත යුතුය. එසේ නොමැතිව වෙනත් දේශපාලන පක්ෂයක සාමාජිකත්වය ලබන අයෙකුගේ නව ලංකා නිදහස් පෙරමුණේ සාමාජිකත්වය නිරායාසයෙන්ම අහෝසි වේ.

v. පක්ෂ සභාපතිගේ එකඟතාවය හෝ උපදෙස් මත විශේෂිත අවස්ථාවන්හිදි විශේෂිත පුද්ගලයන්ට සාමාජිකත්වය ලබාදීමට ලේකම්වරයාට බලය තිබේ.

12.3 සාමාජික ගාස්තු

i. පක්ෂයේ මධ්‍යම කාරක සභාව විසින් තීරණය කරනු ලබන මුදලක් වාර්ෂික සාමාජික ගාස්තු ලෙස සෑම සාමාජිකයකු සිය අයදුම්පත ඉදිරිපත් කිරීමේදී ගෙවිය යුතුය.

ii. පක්ෂයේ පාර්ලිමේන්තු, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල නියෝජිතයින් ලෙස පත්වන සියලු දෙනා පක්ෂයේ මධ්‍යම කාරක සභාව විසින් තීරණය කරනු ලබන අනුග්‍රාහක සාමාජික ගාස්තුවක් මාසිකව ගෙවිය යුතුය.

iii. විධායක සභිකයින් සියලු දෙනාම පක්ෂයේ මධ්‍යම කාරක සභාව විසින් තීරණය කරනු ලබන අතිරේක සාමාජික ගාස්තුවක් එකී රැස්වීමට සහභාගී වීමට පෙර ගෙවිය යුතුය.

12.4 සාමාජිකත්වයේ වගකීම

i. පක්ෂයේ ව්‍යවස්ථාව අනුව කටයුතු කිරීමට බැඳී සිටියි.

ii. පක්ෂයේ ප්‍රතිපත්ති ආරක්ෂා කිරීමටත් ඒ අනුව කටයුතු කිරීමටත් බැඳී සිටියි.

iii. පක්ෂයේ අරමුණු සාක්ෂාත් කරගැනීම උදෙසා කටයුතු කිරීමට බැඳී සිටියි.

iv. ජනතාව අතර පක්ෂය අප්‍රසාදයට හෝ අපකීර්තියට පත්වීම වැළැක්වීමටත්, පක්ෂයේ ජනප්‍රියත්වය වර්ධනය කිරීම සඳහා කටයුතු කිරීමටත් බැඳී සිටියි.

v. සෑම විටකම පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ තීන්දු සහ තීරණ අනුව කටයුතු කිරීමට බැඳී සිටියි.

vi. ඕනෑම මැතිවරණයකදී පක්ෂය විසින් ඉදිරිපත් කරන අපේක්ෂකයින්ට සහයෝගය දෙමින්, ඔවුන් ජයග්‍රහණය කරවීමට කටයුතු කිරීමටත්, පක්ෂයේ අපේක්ෂකයින් ඉදිරිපත් නොකරන අවස්ථාවකදී පක්ෂයේ මධ්‍යම කාරක සභාව සහ විධායක සභාව විසින් ගනු ලබන තීරණය පරිදි කටයුතු කිරීමටත් බැඳී සිටියි.

vii. ඉහත i,ii,iii,iv,v සහ vi අනු වගන්තිවල සඳහන් කරුණු අවබෝධ කරගනිමින් විනයවත් පක්ෂ සාමාජිකයකු ලෙස කටයුතු කිරීමට සියලු සාමාජිකයින් බැඳී සිටියි.

**13 වන වගන්තිය**

උපදේශක සභාව

ජාතික ප්‍රතිපත්ති සම්පාදනයට, ජාතික සහ ජාත්‍යන්තර වැදගත්කමකින් යුත් කටයුතු සඳහා බුද්ධිමය දායකත්වයක් ලබා ගැනීමට විවිධ ක්ෂේත්‍රවල ප්‍රවීණත්වයන්ගෙන් සමන්විත උපදේශක මණ්ඩලයක් පත් කර ගත යුතු ය. සභාපති විසින් මධ්‍යම කාරක සබාවේ අනුමැතියට යටත්ව දස දෙනෙකුගෙන් යුත් විශේෂඥ දැනුම සහිත පිරිසක් ඒ සඳහා පත් කර ගත යුතු ය.

**14 වන වගන්තිය**

නිලවරණය

සෑම දෙවසරකට ම වරක් විධායක සභා රැස්වීමකදී නිලවරණයක් පවත්වා පක්ෂයේ නව නිලධාරී මණ්ඩලයක් පත් කර ගත යුතුය. නිලවරණය සඳහා දන්වා යවන ලිපියේ ඒ පිළිබඳ පැහැදිලිව සඳහන් කර දැනුවත් කළ යුතුය.

පක්ෂයේ විධායක සභාව, මධ්‍යම කාරක සභාව, දිස්ත්‍රික් සංවිධානය, මැතිවරණ බල ප්‍රදේශ සංවිධානය සහ ශාඛා සමිතිය ද වසර දෙකකට වරක් අලුතින් පත්විය යුතුය.

**15 වන වගන්තිය**

පොදු විධිවිධාන

1. පක්ෂයේ පළමු වගන්තියේ සඳහන් අරමුණු සහ දෙවන වගන්තියේ සඳහන් ප්‍රතිපත්ති කිසිදු හේතුවක් නිසා ඉවත් කළ නොහැකි අතර එකී ප්‍රතිපත්ති උල්ලංඝනය කිරීමක් හෝ යටපත් කිරීමක් සිදු වන ලෙසට ඊට නව සංශෝධන ඉදිරිපත් කිරීමට ද නොහැකිය.

2. ඉහත 1 වගන්තියට යටත්ව පක්‍ෂයේ අරමුණු සහ ප්‍රතිපත්ති කාලීන අවශ්‍යතා අනුව ඇතුලත් කිරීමට මධ්‍යම කාරක සභාවට බලය තිබේ. එහෙත් එම යෝජනා පක්‍ෂයේ උපදේශක සභාවෙන් සහ විධායක සභාවෙන් අනුමත කිරීමෙන් පසුව පමණක් මධ්‍යම කාරක සභාව විසින් අනුමත කළ යුතුය.

3. කිසියම් වර්ෂයක නව නිලධාරීන් පත් කරන තෙක් ඒ වන විට එම තනතුරු දරන්නන් පක්‍ෂ නිලධාරීන් මණ්ඩල ලෙස පිළිගැනෙයි.

4. පක්‍ෂය විසින් ගනු ලබන තීරණයක් මධ්‍යම කාරක සභාවේ බහුතර ඡන්දයෙන් සම්මත කළ හැකිය. කිසියම් යෝජනාවකට ඡන්දය විමසීමකදී ඊට පක්‍ෂව හා විපක්‍ෂව සමාන ඡන්ද ප්‍රමාණයක් ලැබී ඇත්නම් සභාපතිවරයාගේ තීරක ඡන්දයෙන් අවසන් තීරණය ගත හැකිය.

5. මෙම ව්‍යවස්ථාවේ ඇතුළත් ඕනෑම සංවිධානයක රැස්වීමක ගණ පූර්ණය ඒ වන විට ඒ ඒ සංවිධානවල සාමාජිකත්වය දරන පිරිසෙන් 1/3 කි.

**16 වන වගන්තිය**

ව්‍යවස්ථා සංශෝධනය

ව්‍යවස්ථා සංශෝධනයක් සිදු කිරීමේ දී පක්‍ෂ සභාපති හරහා මධ්‍යම කාරක සභාවේ අනුමැතිය ලබාගෙන, විධායක සභාවේ ද අනුමැතියෙන් පමණක් ව්‍යවස්ථා සංශෝධනයක් සිදු කළ යුතුය.